උපදෙස් පත්‍රිකා :- 02/2025

මගේ අංකය- DCDSP/02/22/04
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
පෙට්ටිගලවත්ත,ගාල්ල.
2025.03. ൨໐

ගරු සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය/ සාමාන්‍යාධිකාරී/කළමණාකරු,
(දකුණු පළාත තුල ලියාපදිංචි සියළුම සමුපකාර සමිති)

**2025 පළාත් පාලන මැතිවරණ කාල සීමාව තුළ සමුපකාර සමිති විසින් අනුගමනය කල යුතු කරුණු සම්බන්ධවයි**

2025 පළාත් පාලන මැතිවරණය 2025.05.06 දින පැවැත්වන බව මැතිවරණ කොමිෂන් සභාවේ අංක LAE/2025/02 හා 2025.03.20 දිනැති ලිපිය මගින් ප්‍රසිද්ධ කර ඇත.

02. ඒ අනුව මෙම මැතිවරණ කාල සීමාව තුළ සමුපකාර සමිති විසින් පහත දක්වා ඇති පොදු උපදෙස් අනුගමනය කරන ලෙස කාරුණිකව දන්වමි.

- පළාත් පාලන මැතිවරණය සඳහා නාම යෝජනා කැඳවීමේ දැන්වීම ප්‍රසිද්ධ කර ඇති 2025.03.03 දින සිට ඡන්ද විමසීම පවත්වා ප්‍රතිඵල ප්‍රකාශයට පත් කර අවසන් කරන තෙක් වන කාල සීමාව මැතිවරණ කාල සීමාව වශයෙන් හඳුන්වනු ලබයි.

- එම කාල සීමාව තුල, කිසිදු දේශපාලන පක්ෂයක්/ ස්වාධින කණ්ඩායමක් හෝ අපේක්ෂකයෙක් ප්‍රවර්ධනය වන ආකාරයෙන් හෝ යම් දේශපාලන පක්ෂයක්/ ස්වාධින කණ්ඩායමක් හෝ අපේක්ෂකයෙක් අගතියට පත් වන ආකාරයෙන් සමුපකාර සමිති කටයුතු නොකළ යුතු අතර එහිදී සමුපකාර සමිති සතු වාහන, ගොඩනැගිලි, ඉඩම් ඇතුළු නිශ්චල හා චංචල දේපළ අනිසි ලෙස දේශපාලන කටයුතු සඳහා භාවිතා කිරිම හෝ එසේ කිරීමට ඉඩ නොදිය යුතුය.

- සමුපකාර සමිති පරිශ්‍රය හා සමුපකාර සමිතියට අයත් සියලු පරිශ්‍රයන් තුළ දේශපාලන ප්‍රචාරක කටයුතු සිදු නොකල යුතු අතර එසේ කිරීමට කිසිදු දේශපාලන පක්ෂයකට/ ස්වාධින කණ්ඩායමකට හෝ අපේක්ෂකයෙකුට අවස්ථාවක් ලබා නොදිය යුතුය.

- තම සේවකයින්ට රාජකාරි කාල සීමාව තුළ ක්‍රියාකාරි දේශපාලන කටයුතු කිරීමට ඉඩ නොදිය යුතු අතර සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලයද රාජකාරි කාල සීමාව තුළ කිසිදු ක්‍රියාකාරි දේශපාලන කටයුත්තක නිරත නොවිය යුතුය.

- අතවශ්‍ය අවස්ථාවකදී හැර මැතිවරණ කාල සීමාව තුල සමිතියට නව සේවකයින් බඳවා ගැනිම, උසස් කිරිම හෝ ස්ථාන මාරු කිරිම නොකල යුතු අතර, සුවිශේෂි අතවශ්‍ය අවස්ථාවකදී නම් ඒ පිළිබඳ මා දැනුවත් කර සමුපකාර සේවක කොමිෂන් සභාව විමසා අවශය ඉදිරි කටයුතු සිදු කල යුතුය.

- සාමාන්‍ය කාල සීමා වලදී, කිසියම් දේශපාලන පක්ෂයකට/ ස්වාධින කණ්ඩායමකට හෝ පුද්ගලයෙකුට මුදල් ගෙවා වෙන් කර ගත හැකි සමුපකාර සමිති සතු නිශ්චල හා චංචල දේපළ දේශපාලන කටයුතු සඳහා භාවිතා කිරීමට නිසි පරිදි ඉල්ලුම් කරනු ලබන දේශපාලන පක්ෂයකට/ ස්වාධින කණ්ඩායමකට හෝ අපේක්ෂකයෙකුට ඒ සඳහා නියමිත ගාස්තු අය කර ගැනීමෙන් හා අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කිරීමෙන් පසු සුදුසු පරිදි අවස්ථාව ලබා දිය හැකි අතර, එවැනි අවස්ථාවක සමුපකාර සමිතියේ දෛනික කටයුතු අඩාල නොවන බවට සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය හා සාමාන්‍යාධිකාරී සහතික විය යුතුය. තවද මෙහිදී සෑම දේශපාලන පක්ෂයකටම/ ස්වාධින කණ්ඩායමකටම හෝ අපේක්ෂකයෙකුටම සාධාරණ

අවස්ථාවක් ලැබෙන පරිදි විනිවිදභාවයෙන් යුතුව කටයුතු කල යුතු අතර ඒ සඳහා සුදුසු පූර්ව සැලැස්මක් සකස් කර ගත යුතුය. එසේම සමුපකාර සමිති සතු නිශ්චල හා චංචල දේපළ බද්දට හෝ කුලියට ලබා දෙනු ලබන ආකාරය, ඒ සඳහා වන කොන්දේසි මොනවාද යන්න පැහැදිලිව නිශ්චය කර ගෙන ඒ බව ප්‍රදර්ශණය කල යුතු වන අතර ඊට අනුකූලව කටයුතු කල යුතුය.

- මැතිවරණ කාල සීමාව තුල සමුපකාර සමිතියක යම් ඉදි කිරීමක් ආරම්භ කරන්නේ නම්, විවෘත කිරීමක් සිදු කරන්නේ නම් හෝ වෙනත් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්නේ නම් එවැනි කාර්යන් කිසිදු දේශපාලන පක්ෂයක/ ස්වාධීන කණ්ඩායමක නියෝජනයක් හෝ මැතිවරණ අපේක්ෂකයෙකුගේ නියෝජනයක් නොමැතිව සමුපකාර නීතියට අනුව සිදු කල යුතුය.

- සමුපකාර සමිති නමින් පවත්වාගෙන යනු ලබන සමාජ ජාලා ගිණුම් මැතිවරන කාල සීමාව තුල භාවිතා කිරීමේදී කිසිදු දේශපාලන පක්ෂයක්/ ස්වාධින කණ්ඩායමක් හෝ අපේක්ෂකයෙක් ප්‍රවර්ධනය වන ආකාරයෙන් හෝ යම් දේශපාලන පක්ෂයක්/ ස්වාධින කණ්ඩායමක් හෝ අපේක්ෂකයෙක් අගතියට පත් වන ආකාරයෙන් තොරතුරු, කරුණු හෝ අදහස් ප්‍රකාශ කිරීමෙන් හෝ හුවමාරු කිරීමෙන් වැළකී සිටිය යුතු අතර සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය හා විධායක නිලධාරීන් ඒ පිළිබඳ අවශ්‍ය සොයා බැලීම් කල යුතුය.

- 2025 පළාත් පාලන මැතිවරණයට අපේක්ෂයකයන් වශයෙන් ඉදිරිපත්වී ඇති අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් හා සමිති සේවකයින් සම්බන්ධයෙන් පිලිවෙලින් මාගේ සමාංක 2025.03.17 උපදෙස් පත්‍රිකා 01/2025හි හා සමුපකාර සේවක කොමිෂන් සභාවේ අංක SP/CEC/I/O/5 හා 2023.06.01 දිනැති චක්‍රලේඛ අංක 02/2023 හි සඳහන් උපදෙස් අනුව කටයුතු කල යුතුය.

- මැතිවරණය පවත්වනු ලබන දිනයේ ස්ව සේවකයින්ට බාධාවකින් තොරව තම ඡන්දය භාවිතා කිරීමට හැකි වන පරිදි ප්‍රමාණවත් කාලයක් නිවාඩු ලබා දීමට කටයුතු කල යුතුය.

03. තවද මැතිවරණ කොමිෂන් සභාවේ අංක EC/EDR/LAE/2025/05 හා 2025.03.03 දිනැති චක්‍රලේඛ අංක LAE/2025/06 දරණ චක්‍රලේඛය කෙරෙහි අවධානය යොමු කරන ලෙසත්, මේ සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන උපදෙස් හා නියෝග අනුව කටයුතු කරන ලෙසත්, මේ සම්බන්ධයෙන් ඔබ සමිතියේ සියළු නිලධාරීන් හා සේවකයින් දැනුවත් කරන ලෙසත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

සී. වික්‍රමසිංහ
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් (වැ.බ.)
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
දකුණු පළාත.

සී.වික්‍රමසිංහ,
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
දකුණු පළාත.

පිටපත්-

01. ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය, ගාල්ල - කාරු.දැ.පි
02. ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,ගාල්ල - කාරු.දැ.පි
03. ලේකම්, කෘෂිකර්ම.....සමුපකාර අමාත්‍යාංශය, ලබුදූව - කාරු.දැ.පි
04. සහකාර කොමසාරිස්, (ගාල්ල/මාතර/හම්බන්තොට) - මේ සම්බන්ධව සියළුම සමුපකාර සමිති දැනුවත් කිරීමට
05. සමුපකාර සංවර්ධන ප්‍රාදේශීය නිලධාරීන් - ඔබ බල ප්‍රදේශයේ සියළුම සමුපකාර සමිති දැනුවත් කිරීමට